# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1620/22 - 2009 සැප්තැම්බර් 24 වැනි බ්‍රහස්පතින්දා - 2009.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1997 නොවැම්බර් මස 19 වැනි දින අංක 1,002/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 1997 අගෝස්තු 01 වැනි දිනට බලාත්මක වූ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට පහත දැක්වෙන ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි පළ කරනු ලැබේ.

ඩී. දිසානායක,<br>
ලේකම්,<br>
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 22 වැනි දින,<br>
කොළඹ 07,<br>
නිදහස් චතුරස්‍රය,<br>
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ දී ය.

1. *ක්‍රියාත්මක වන දිනය :*

1997 නොවැම්බර් මස 19 අංක 1,002/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන් අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි මෙම ව්‍යවස්ථා සංග්‍රහය 2009 සැප්තැම්බර් මස 02 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. *නිර්වචන :*

"ව්‍යවස්ථා සංග්‍රහය" යන පදයෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය වේ.

"අධ්‍යක්ෂ ජනරාල්" යන පදයෙන් අදහස් කරනුයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වේ.

"සේවය" යන පදයෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය වේ.

"සතුටුදායක සේවා කාලය" යන පදයෙන් අදහස් කරනුයේ සියලු වැටුප් වර්ධක නියමිත දිනට උපයා ගෙන ඇති සහ වරදකට, අවවාද කිරීම් හැර වෙනත් කිසිදු දඬුවමක් ලබා නැති සක්‍රීය සේවා කාලය වේ.

"සක්‍රීය සේවා කාලය" යන පදයෙන් අදහස් කරනුයේ රාජ්‍ය වුවමනාවන්ට හෝ/හා රාජ්‍ය ප්‍රතිපත්තිමය හේතුවලට යටත්ව ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින්, තමාට පැවරෙන තනතුරෙහි සත්‍ය වශයෙන්ම සේවය කරන ලද කාලසීමාව වේ.

1A - G 11760 — 835 (2009/09)

"විශ්වවිද්‍යාල උපාධියක්" යන පදයෙන් අදහස් කරනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් විශ්වවිද්‍යාලයක් වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් වේ.

"පුස්තකාල විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව" යන පදයෙන් අදහස් කරනුයේ විශ්වවිද්‍යාලයක්/ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් පිරිනමන එම ඩිප්ලෝමාව හෝ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය අනුමත කරනු ලැබූ ඩිප්ලෝමා සහතිකයක් වේ.

3. *පුස්තකාලයාධිපති සේවයේ ව්‍යුහය :*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් රාජ්‍ය සේවය හැරුණු විට රජය යටතේ පවතින පුස්තකාලවල පහත සඳහන් පන්තිවලින් සමන්විත පුස්තකාලයාධිපතිවරුන්ගෙන් මෙම සේවය සමන්විත වේ.

4. *සේවක සංඛ්‍යාව :*

| *පන්තිය* | *සේවක සංඛ්‍යාව* |
|---|---|
| III පන්තිය | 285 |
| II පන්තිය | 123 |
| I පන්තිය | 91 |
| විශේෂ පන්තිය | 47 |

*සටහන.*— රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ඒ ඒ පන්ති සඳහා තිබිය යුතු තනතුරු සංඛ්‍යාව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නිර්දේශ මත ආයතන සංග්‍රහයේ දෙවැනි පරිච්ඡේදයේ පළමුවැනි ඡේදයේ විධිවිධානවලට යටත්ව හා ඒ ඒ ආයතනවල අවශ්‍යතාවය පරිදි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

(පුස්තකාල ශ්‍රේණීන් සහ තනතුරු සංඛ්‍යාව පිළිබඳ පස්වන පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.)

5. *වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන 06/2006 චක්‍රලේඛය අනුව —

| *පංතිය* | *වැටුප් කාණ්ඩය* | *වැටුප් පරිමාණය* |
|---|---|---|
| III පන්තිය | MN 3 | රු. 14,510 — 150 x 4 - 205 x 6 - 290 x 20 - 320 x 11 — රු. 25660 |
| II පන්තිය | MN 3 - 12 | ආරම්භක පියවර රු. 16,490 |
| I පන්තිය | MN 3 - 23 | ආරම්භක පියවර රු. 19,735 |
| විශේෂ පන්තිය | MN 7 | රු. 19,755 — 325 x 15 - 400 x 11 — රු. 29,030 |

මෙම වැටුප් පරිමාණයන් රජය මගින් වරින් වර කරනු ලබන සංශෝධනවලට යටත්ය.

6. *පත්කිරීම හා උසස් කිරීම :*

6.1 *පත්කිරීමේ හා උසස් කිරීමේ ක්‍රමය :*

6.1.1 III පන්තිය, බඳවා ගැනීම් පන්තිය වන අතර සීමිත හා විවෘත යන දෙඅංශයෙන් ඉල්ලුම්පත් කැඳවා පැවැත්වෙන විභාගවලින් ලබන කුසලතාව මත පහත ආකාරයට තෝරා පත් කෙරේ.

පුරප්පාඩු වලින් 70% විවෘත තරග විභාගයක ඉල්ලුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබන්නන්ගෙන් ද, පුරප්පාඩුවලින් 30% සීමිත තරග විභාග ඉල්ලුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබන්නන්ගෙන් ද පුරවනු ලැබේ.

සීමිත තරග විභාගය යටතේ සුදුසුකම් ලබන්නන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී එම ප්‍රමාණය ද විවෘත තරග විභාගය යටතේ සුදුසුකම් ලබන්නන්ගෙන් ලකුණු අනුපිළිවෙල අනුව පුරවනු ලැබේ.

6.1.2 II පන්තිය - 6.3.2 සඳහන් පරිදි උසස් කරනු ලැබේ.
6.1.3 I පන්තිය - 6.3.3 සඳහන් පරිදි උසස් කරනු ලැබේ.
6.1.4 විශේෂ පන්තිය - 6.3.4 සඳහන් පරිදි උසස් කරනු ලැබේ.

*සටහන.*— III පන්තියට පත්කළ යුතු සංඛ්‍යාව වන්නේ පෙර වසරේ දෙසැම්බර් 31 දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාවය.

6.2 *විභාග ක්‍රමය :*

සේවා ව්‍යවස්ථාව ප්‍රකාර බඳවා ගැනීම් විභාග, ප්‍රසිද්ධ ගැසට් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබේ.

විභාගය සමත්වීම සඳහා 40% ක අවම ලකුණු ප්‍රතිශතයක් සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලබාගත යුතුය.

ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ III පන්තියට බඳවා ගැනීමේ තරග විභාග ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විතය.

(විභාග පිළිබඳ විස්තර පළමුවන පරිශිෂ්ඨයේ දක්වා ඇත.)

ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ II පන්තියට උසස් කිරීමේ විභාග ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විතය.

(විභාග පිළිබඳ විස්තර දෙවන පරිශිෂ්ඨයේ දක්වා ඇත.)

විවෘත තරග විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථා තුනකට වඩා කිසිවෙකුට ඉඩදෙනු නොලැබේ.

බඳවා ගැනීම් සඳහා ද තිබිය යුතු සුදුසුකම් බඳවා ගැනීම් විභාගයට ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට සහ උසස්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් උසස්වීම් විභාගයට ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට හෝ ඊට පූර්වයෙන් සම්පූර්ණ කර තිබිය යුතුය.

6.3 *එක් එක් පන්තියට පත්කිරීමේ හා උසස් කිරීමට සුදුසුකම් :*

6.3.1 *III පන්තියට පත්කිරීම සඳහා සුදුසුකම් :*

6.3.1.1 විවෘත තරග විභාගය මගින් —

(*අ*) ශ්‍රී ලාංකික පුරවැසියකු වීම ;

සහ

(*ආ*) ඉල්ලුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි වීම ;

සහ

(*ඇ*) (i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා 3 න් එකකට අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් තිබීම,

සහ

(ii) ගණිතය සහ වෙනත් විෂයයන් 2 කට සම්මාන සහිතව විෂයයන් 6 කින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්වීමය. මින් විෂයයන් 5 ක් එකවර සමත්ව තිබීම,

ඊට අමතරව අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී ඕනෑම විෂයයන් 3 කින් සමත් ව තිබීම ;

සහ

(*ඈ*) (i) පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම,

හෝ

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

6.3.1.2 සීමිත තරග විභාගය මගින් —

(*අ*) රාජ්‍ය සේවයේ පුස්තකාල සහායක/පුස්තකාල සේවක තනතුරේ ස්ථිර කර තිබීම සහ එම තනතුරෙහි වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම සහ අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. (මේ සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.);

සහ

(ආ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව පළමු වසර සමත්ව තිබීම ;

හෝ

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසර සමත්ව තිබීම.

6.3.2 *II පන්තියට උසස් කිරීම* :

6.3.2.1 සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම මගින් —

(අ) පූර්ව අවශ්‍යතා :

(i) III පන්තියේ සේවයේ ස්ථිර කර තිබීම ;

සහ

(ii) III පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම නියමිත කාලය තුළ සමත්ව තිබීම ;

සහ

(iii) III පන්තියේ වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම ;

සහ

(iv) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පූර්වාසන්න වසර 10 තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම ;

සහ

(v) උසස්වීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

(vi) අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.

(ආ) *උසස්වීමේ ක්‍රමය* :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් II පන්තියට උසස් කිරීම, පත්වීමේ බලධාරියා විසින් හඳුන්වාදෙනු ලැබූ ආකෘතියක් මගින් පත්වීමේ බලධාරියා වෙත අදාළ සේවකයා විසින් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව කළ පත්වීමේ බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

6.3.2.2 සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම මගින් —

(අ) *පූර්ව අවශ්‍යතා* :

(i) III පන්තියේ සේවයේ ස්ථිර කර තිබීම ;

සහ

(ii) සේවයේ III පන්තියේ වසර 06 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

සහ

(iii) III පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනයේ දී සමත් ව තිබීම ;

සහ

(iv) අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්න වසර 06 තුළ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම ;

සහ

(v) උසස්වීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

සහ

(vi) අදාළ මට්ටමේ දෙවැනි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම ;

සහ

(vii) පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව හා විඥාපන විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය සමත් ව තිබීම ;

හෝ

(viii) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය/පුස්තකාල විද්‍යා හා විඥාපන විද්‍යා සාමාන්‍ය උපාධිය සමත් ව තිබීම ;

සහ

(ix) පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත් ව තිබීම ;

හෝ

(x) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත් ව තිබීම.

6.3.2.3 සුවිශේෂී කාර්ය සාධනය යටතේ විභාගය මගින් —

(අ) *පූර්ව අවශ්‍යතා :*

(i) III පන්තියේ සේවයේ ස්ථිර කර තිබීම, විභාගයට අයදුම්පත් කැඳවන අවසාන දිනට වසර 06 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එදිනට පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

සහ

(ii) III පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් ව තිබීම ;

සහ

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමාව සමත් ව තිබීම ;

හෝ

(iv) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමාව සමත් ව තිබීම ;

සහ

(v) මෙම විභාගය සඳහා එක් නිලධාරියෙකුට පෙනී සිටිය හැක්කේ එක්වරක් පමණි.

6.3.3 *I පන්තියට උසස් කිරීම :*

6.3.3.1 සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම මගින් —

(අ) *පූර්ව අවශ්‍යතා :*

(i) II පන්තියේ පුස්තකාලයාධිපති තනතුරක වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම සහ අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම ;

සහ

(ii) පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

සහ

(iii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ පූර්වාසන්න වසර 10 තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කිරීම ;

සහ

(iv) II පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් ව තිබීම.

(ආ) *උසස්වීමේ ක්‍රමය :*

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් I පන්තියට උසස් කිරීම, පත්වීම් බලධාරියා විසින් හඳුන්වාදෙන ආකෘතියක් මගින් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව පත්වීම් බලධාරියා වෙත අදාළ සේවකයා විසින් ඉල්ලීමක් කළ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

6.3.3.2 සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම මගින් —

(අ) *පූර්ව අවශ්‍යතා :*

(i) II පන්තියේ පුස්තකාලයාධිපති තනතුරක වසර 06 ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම සහ අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම ;

සහ

(ii) පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

සහ

(iii) අනුමත කාර්ය සාධනය ඇගයීම් පරිපාටිය අනුව පූර්වාසන්න වසර 06 තුළ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම ;

සහ

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනයේ දී සමත්ව තිබීම.

*(ආ) උසස්වීමේ ක්‍රමය :*

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් I පන්තියට උසස් කිරීම, පත්වීම් බලධාරියා විසින් හඳුන්වාදෙනු ලැබූ ආකෘතියක් මගින් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිතව අදාළ සේවකයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව II පන්තියට උසස් වී වසර 06 ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

6.3.4 *විශේෂ පන්තියට උසස් කිරීම සඳහා සුදුසුකම් :*

*(අ)* (i) I පන්තියේ පුස්තකාලයාධිපති තනතුරක වසර 5ක සතුටුදායක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

සහ

පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යා හා විඥාපන විද්‍යාව පිළිබඳ එක් අවුරුදු පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සමත්ව තිබීම ;

හෝ

(ii) I පන්තියේ පුස්තකාලයාධිපති තනතුරක වසර 3ක සතුටුදායක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

සහ

පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යා හා විඥාපන විද්‍යා දෑ අවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධිය සමත්ව තිබීම ;

සහ

*(ආ)* විශ්වවිද්‍යාලයක්/පිළිගත් රජයේ ආයතනයක් හෝ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් පවත්වනු ලබන පැය 160කට නොඅඩු, පුස්තකාල විද්‍යාව පිළිබඳ පරිගණක පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම ;

සහ

*(ඇ)* වරලත් පුස්තකාලයාධිපති තත්ත්වය ලබා තිබීම.

*සටහන.*— 6.3.4 යටතේ සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත ලකුණු දීමේ පටිපාටියක් මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත සම්මුඛ පරීක්ෂණයක් මගින් විශේෂ පන්තියෙහි පවත්නා පුරප්පාඩු සඳහා උසස් කරනු ලැබේ.

(සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමය හා තෝරා ගැනීම් පරිපාටිය පිළිබඳ විස්තර සිව්වන පරිශිෂ්ඨයේ දක්වා ඇත.)

7. *ස්ථිර කිරීම :*

7.1 විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III පන්තියට පත්කරනු ලබන නිලධාරියකු වසර 03ක පරිවාස කාලයකට යටත් වේ. පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් වීම සහ නිලධරයාගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමට පත්වීම යන කරුණු සම්පූර්ණ වීම මත අධ්‍යක්ෂ ජනරාල් විසින් නිලධරයෙකු සිය තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

7.2 සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III පන්තියට පත්කරනු ලබන නිලධාරියකු වසරක වැඩ බැලීමේ කාලයකට යටත්වේ. වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමට පත්වීම යන කරුණු සම්පූර්ණ වීම මත අධ්‍යක්ෂ ජනරාල් නිලධරයෙකු සිය තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

*සටහන.*— පරිවාස කාලය හා ස්ථිර කිරීම පිළිබඳ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ වේ.

8. *කාර්යක්ෂමතා කඩඉම :*

III හා II පන්ති වල පත්වීම් දිනය/උසස්වීම් දිනය සිට 3 වන වසර ඉක්මවීමට පෙර අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතු වේ. නියමිත කාල පරිච්ඡේදය තුල කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවීම මත වැටුප් වර්ධක විලම්බනය කරනු ලැබේ. (මේ පිළිබඳව ආයතන සංග්‍රහයේ II : 11 වගන්තිය අදාල වේ.)

8.1 එක් පන්තියක් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාල විෂයන් සියල්ලට ම එකවර පෙනී සිටීමට හෝ වෙන්වෙන් අවස්ථාවල පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

8.2 යම් පන්තියකට අයත් කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය හැක්කේ එම පන්තියට අයත් නිලධාරීන්ට පමණි.

8.3 කාර්යක්ෂමතා කඩඉම් විභාග, සමත් වීම අවශ්‍ය වන අතර ඉන් නිදහස් කිරීම කරනු නොලැබේ.

8.4 සේවා ව්‍යවස්ථාව ප්‍රකාර කාර්යක්ෂමතා කඩඉම් විභාග පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලැබේ.

8.5 සෑම වසරක ම 4 වන කාර්තුව තුල වසරකට වරක් පමණක් කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වනු ලැබේ.

II හා III පන්ති සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශයන් සඳහා තෙවන පරිශිෂ්ඨය බලන්න.

9. *අන්තර්ග්‍රහණය :*

9.1 *තනතුරු අන්තර්ග්‍රහණය :*

පළාත් රාජ්‍ය සේවය හැර රාජ්‍ය සේවයට අයත් සියළුම පුස්තකාලයාධිපති තනතුරු මෙම ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයට අන්තර්ග්‍රහණය වේ.

එසේ වුවද, මෙම ව්‍යවස්ථාව බලාත්මක වන දිනට ඉහත 9.1 යටතට ගැනෙන තනතුරක සේවය කරන නිලධාරියකු සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල නොකරන විට එම නිලධාරියාගේ සේවා කාලය අවසන් වීම සමග එම තනතුර සේවයට අන්තර්ග්‍රහණය වේ.

9.2 *නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම :*

9.2.1 *සේවයට දැනටමත් අන්තර්ග්‍රහණය වී සිටින නිලධාරීන් නව ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය කිරීම :*

1997.08.01 දිනට පෙර ඉහත 9.1 යටතට ගැනෙන තනතුරක සේවයට බැඳුනු, 1997.08.01 දිනට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණයව සිටි 1997.08.01 දින සිට මෙම නව ව්‍යවස්ථාව බලාත්මක වන දින අතර කාලය තුල සේවයෙහි යෙදී සිටි පුස්තකාලයාධිපතිවරුන් මෙම නව ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය කිරීම පහත දැක්වෙන පරිදි ක්‍රියාත්මක කෙරේ.

9.2.1.1 නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට III වැනි ශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන් III වැනි පන්තියට අන්තර්ග්‍රහණය කෙරේ.

9.2.1.2. නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට II වැනි ශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන් II වැනි පන්තියට අන්තර්ග්‍රහණය කෙරේ.

9.2.1.3 නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට I වැනි ශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන් I වැනි පන්තියට අන්තර්ග්‍රහණය කෙරේ.

9.2.1.4 නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට අධිශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන් විශේෂ පන්තියට අන්තර්ග්‍රහණය කෙරේ.

9.2.2 *සේවයට අන්තර්ග්‍රහණය වී නොමැති නිලධාරීන් නව ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය කිරීම :*

9.2.2.1 1997.08.01 දිනට පෙර ඉහත 9.1 යටතට ගැනෙන තනතුරක සේවයට බැඳී සිටි එහෙත් 1997.08.01 දිනට බලාත්මක වූ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණයව නොසිටියා වුවද මෙම නව ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල කරන නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම.

1997.08.01 දිනැති අංක 1,002/13 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවේ අංක 03 ඡේදය යටතේ අන්තර්ග්‍රහණය වීමට නියමිත ශ්‍රේණියට අන්තර්ග්‍රහණයව සිටියාසේ සලකා, එම ශ්‍රේණිය පදනම් කරගෙන ඉහත 9.2.1 විධිවිධාන අනුව අන්තර්ග්‍රහණය කරනු ලැබේ. එම නිධාරීන් හට මෙම නව ව්‍යවස්ථාවේ අංක 10 ඡේදය අනුව උසස්වීම් ලැබීමට හිමිකම ලැබේ.

9.2.2.2 1997.08.01 දිනට පසු ඉහත 9.1 යටතට ගැනෙන තනතුරක සේවයට බැඳුනු සහ 1997.08.01 දිනට බලාත්මක වූ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයෙහි ව්‍යවස්ථාව මගින් පාලනය නොවුනු එහෙත් මෙම නව ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල කරන නිලධාරීන් නව ව්‍යවස්ථාවේ III වැනි පන්තියට අදාල සුදුසුකම් සපුරා ඇත්නම් එම පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන අතර මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව උසස්වීම් ලබා ගැනීමට හිමිකම ලබනු ඇත. මෙම නිලධාරීන් සඳහා අන්තර්කාලීන විධිවිධාන බල නොපැවැත්වේ.

10. *අන්තර් කාලීන විධිවිධාන :*

10.1 මෙම නව ව්‍යවස්ථාව බලාත්මක වන දින සිට තෙවසරක් ඉක්මගිය වහාම 6 ඡේදය යටතේ සඳහන් උසස්වීම් ක්‍රම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනු ඇත. 1997.08.01 දිනට බලාත්මක වන පරිදි ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් සහ ඉහත 9.2.2.1 යටතට ගැනෙන නිලධාරීන් සඳහා පමණක් අන්තර්කාලීන විධිවිධාන අදාල වේ.

10.2 *අන්තර්කාලය තුල II පන්තියට උසස් කිරීම :*

10.2.1. හෝ 10.2.2 ක්‍රම අතුරින් නිලධාරියකු ඉල්ලුම්කරන ක්‍රමය යටතේ උසස් කිරීම සඳහා සලකා බැලේ.

10.2.1 1997.08.01 දින සිට බලාත්මක වන පරිදි ක්‍රියාත්මක වන සේවා ව්‍යවස්ථාවේ II වැනි පන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගය සඳහා නියමිත විධිවිධාන යටතේ වසරකට වරක් පවත්වනු ලබන විභාගයෙන් සමත්වන නිලධාරීන් II පන්තියට උසස් කරනු ලබේ.

10.2.1.1 *විභාගය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් :*

(අ) ඉහත 10.2.1 ඡේදයෙහි සඳහන් සේවා ව්‍යවස්ථාවේ 06 ඡේදයේ සඳහන් සීමිත තරග විභාගය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා තිබීම.

(ආ) එම ව්‍යවස්ථාවේ 3 ඡේදය අනුව නියමිත කාල පරිච්ඡේදය තුල III වැනි ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව තිබීම.

10.2.1.2 *උසස්වීම් දිනය තීරණය කිරීම (10.2.1 යටතේ වන උසස්වීම් සඳහා) :*

10.2.1.2.1 10.2.1.1 යටතේ දක්වා ඇති සියලු සුදුසුකම් සම්පූර්ණ කල දිනය 1997.08.01 දිනට හෝ පූර්වයෙන් වන විට—

(අ) අන්තර්කාලය තුල පළමුවරට පවත්වන විභාගයෙන් සමත්වන අයගේ උසස්වීම් දිනය 1997.08.01 වේ.

(ආ) දෙවන වරට හා තුන්වන වරට පවත්වන විභාගයෙන් සමත්වන අය සඳහා උසස්වීම් දින පිළිවෙලින් 1998.08.01 හා 1999.08.01 වේ.

10.2.1.2.2 10.2.1.1 යටතේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කල දිනය 1997.08.01 දිනට පසු දිනයක් වන විට—

(අ) අන්තර්කාලය තුල පළමුවරට පවත්වන විභාගයෙන් සමත්වන අයගේ උසස්වීම් දිනය ඉහත 10.2.1.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කල දිනය වේ.

(ආ) දෙවැනි හා තෙවන වරට පවත්වන විභාගයෙන් සමත්වන අය සඳහා උසස්වීම් දිනය ඉහත 10.2.1.1 යටතේ සුදුසුකම් සම්පූර්ණ කල දින සිට, පිළිවෙලින් වසර 1 හා වසර 2 සම්පූර්ණ කල දිනය වේ.

10.2.2 ඉහත 10.2.1.1 යටතේ දැක්වෙන සුදුසුකම් සපුරන හා එම සුදුසුකම් යටතේ දැක්වෙන සේවා කාලයට අමතරව වසර 5 ක සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සපුරන දිනට විභාගයක් නොපවත්වා II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

10.3 *අන්තර්කාලය තුල I පන්තියට උසස් කිරීම :*

10.3.1 හෝ 10.3.2 යන ක්‍රම අතුරින් නිලධාරියකු ඉල්ලුම්කරන ක්‍රමය යටතේ උසස් කිරීම සඳහා සලකා බැලේ.

10.3.1 1997.08.01 දින සිට බලාත්මක වන පරිදි ක්‍රියාත්මක වූ සේවා ව්‍යවස්ථාවේ I වැනි පන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගය සඳහා නියමිත විධිවිධාන යටතේ වසරකට වරක් පවත්වනු ලබන විභාගයෙන් සමත්වන නිලධාරීන් I පන්තියට උසස් කෙරේ.

10.3.1.1 *විභාගය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් :*

(*අ*) (i) ඉහත 10.3.1 සඳහන් සේවා ව්‍යවස්ථාවේ 07 (අ) ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

හෝ

(ii) ඉහත සඳහන් සේවා ව්‍යවස්ථාවේ 07 ඡේදයේ (අ) හැර (ආ)/(ඇ)/(ඈ) හෝ (ඉ) සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

(II ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් සේවය කර තිබීම යනුවෙන් සඳහන් වුවද III ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් සේවය කර තිබීම වුවද ප්‍රමාණවත් වේ.)

සහ

(*ආ*) එම ව්‍යවස්ථාවේ 03 ඡේදය අනුව නියමිත කාල පරිච්ඡේදය තුල අදාල වන පරිදි III/II ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව තිබීම.

10.3.2

(*අ*) ඉහත 10.3.1.1 හි (අ) I සහ (ආ) අවශ්‍යතා සපුරා ඇත්තා වූද 10.3.1.1 හි (අ) I යටතේ සුදුසුකම් වශයෙන් දක්වා ඇති සේවා කාලයට අමතරව වසර 03 ක සේවා කාලයක් සපුරා ඇත්තා වූ ද එම වසර 13 ක සේවා කාලය සම්පූර්ණ කරන දිනට වසර 05 ක සතුටුදායක සක්‍රීය සේවා කාලයක් සපුරා ඇත්තා වූද නිලධාරීන් එම සේවා කාලය සම්පූර්ණ දිනට විභාගයක් නොපවත්වා I පන්තියට උසස් කරනු ලැබේ.

(*ආ*) ඉහත 10.3.1.1 හි (අ) II සහ (ආ) අවශ්‍යතා සපුරා ඇත්තා වූද (අ) II යටතේ දැක්වෙන සේවා කාලයට අමතරව වසර 03 ක සේවා කාලයක් සපුරා ඇත්තා වූ ද එම වසර 08 ක සේවා කාලය සම්පූර්ණ කරන දිනට පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සක්‍රීය සේවා කාලයක් සපුරා ඇත්තා වූද නිලධාරීන් එම සේවා කාලය සපුරන දිනට විභාගයක් නොපවත්වා I පන්තියට උසස් කරනු ලැබේ.

10.3.3 *උසස්වීම් දිනය තීරණය කිරීම (10.3.1 යටතේ වන උසස්වීම් සඳහා) :*

10.3.3.1 10.3.1.1 යටතේ දක්වා ඇති සියලු සුදුසුකම් සම්පූර්ණ කළ දිනය 1997.08.01 දිනට හෝ පූර්වයෙන් වන විට —

(*අ*) අන්තර්කාලය තුල පළමුවරට පවත්වන විභාගයෙන් සමත්වන අයගේ උසස්වීම් දිනය 1997.08.01 වේ.

(*ආ*) දෙවැනි වරට හා තුන්වන වරට පවත්වන විභාගයෙන් සමත්වන අය සඳහා උසස්වීම් දින පිළිවෙලින් 1998.08.01 හා 1999.08.01 වේ.

10.3.3.2 10.3.1.1 යටතේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කළ දිනය 1997.08.01 දිනට පසු දිනයක් වන විට—

(අ) අන්තර්කාලය තුල පළමුවරට පවත්වන විභාගයෙන් සමත්වන අයගේ උසස්වීම් දිනය ඉහත 10.3.1.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කල දිනය වේ.

(ආ) දෙවන හා තෙවන වරට පවත්වන විභාගයෙන් සමත්වන අය සඳහා උසස්වීම් දිනය ඉහත 10.3.1.1 යටතේ සුදුසුකම් සම්පූර්ණ කල දින සිට පිළිවෙලින් වසර 1 හා වසර 2 සම්පූර්ණ කල දිනය වේ.

**සටහන.**—10.2.1 හා 10.3.1 යටතේ විභාග දෙකටම පෙනී සිටීමට III පන්තියේ නිලධාරින් අවසර දෙනු ලැබේ. ඉහත විභාග දෙකම සමත්වන නිලධාරින්ට 10.2 හා 10.3 යටතේ සඳහන් පූර්ව දිනයන්හි දී ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් ලබාදෙනු ලැබේ.

10.4 *විශේෂ පන්තියට අන්තර් කාලය තුලදී උසස් කිරීම :*

1997.08.01 දිනට බලාත්මකව පවත්නා සේවා ව්‍යවස්ථාවේ 8 ඡේදයේ විධිවිධාන පරිදි උසස් කරනු ලැබේ. මෙම උසස්වීම් 1997.08.01 දින සිට, මෙම ව්‍යවස්ථාවේ 10 ඡේදය යටතේ නිශ්චය කර ඇති අන්තර් කාලය අවසන් වන දින තෙක් විශේෂ පන්තියේ (අධි ශ්‍රේණියේ) පැවති පුරප්පාඩු සඳහා පමණක් අදාල විය යුතු අතර එම කාලය තුල සේවයේ යෙදී සිටි සුදුසුකම් සහිත නිලධාරින් උසස් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

11. *පොදු කරුණු :*

11.1 *ස්ථාන මාරු කිරීම්.*—නිලධාරින් ස්ථාන මාරු කල හැක්කේ, නිලධාරියා අයත් පන්තියට අදාල පුරප්පාඩුවක් සහිත පුස්තකාලයකට පමණි.

11.2 මෙම සේවා ව්‍යවස්ථාව බලාත්මක වන දින සිට සේවයට අදාල වූ මෙතෙක් පැවති සියලු ව්‍යවස්ථා හා බඳවා ගැනීම/ උසස් කිරීම පිළිබඳ පැවති චක්‍රලේඛ සියල්ල ම අවලංගු වූ ලෙස සැලකේ.

11.3 මෙම සේවා ව්‍යවස්ථාව යටතේ බඳවා ගනු ලබන සියලුම නිලධාරිහු ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද දෙපාර්තමේන්තු විධිවිධාන වලට ද රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් විධිවිධාන හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිති.

11.4 ව්‍යවස්ථාවේ සඳහන් කරුණු පිළිබඳ අර්ථ දැක්වීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් හෝ කරනු ලැබේ. ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණය කිරීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරෙනු ඇත.

11.5 කාර්ය සාධනය ඇගයීමේ පොදු ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වා දී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්ය සාධන ඇගයීමේදී "හොඳයි " හා "ඉතා හොඳයි " යනුවෙන් වර්ගීකරණය කරනු ලැබ ඇති තැනැත්තන් සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන් වශයෙන් සැලකෙනු ඇත.

## පළමුවන පරිශිෂ්ටය

**ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III පන්තියට බඳවා ගැනීමේ තරග විභාගයේ විෂය නිර්දේශ**

මෙම විභාග ප්‍රශ්ණ පත්‍ර තුනකින් සමන්විත ය.

| | |
|---|---|
| පුස්තකාල විද්‍යාව | (කාලය පැය 3 - ලකුණු 100) |
| බුද්ධි පරීක්ෂණය | (කාලය පැය 1 - ලකුණු 100) |
| සාමාන්‍ය දැනීම | (කාලය පැය 1 - ලකුණු 100) |

විභාගය සමත්වීම සඳහා 40% ක ලකුණු ප්‍රතිශතයක් සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලබාගත යුතු ය.

*(අ) විෂය නිර්දේශය - III පන්තිය විවෘත තරග විභාගය*

**පුස්තකාල විද්‍යාව**

**(1) පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය**

(අ) පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය, පුරාතන සහ නූතන ලෝකයේ ප්‍රධාන පුස්තකාල.

(ආ) ලේඛන කලාවේ සහ පොත් ඇතුළු ලේඛන මාධ්‍යයන්හි ආරම්භය හා විකසනය.

(ඇ) මුද්‍රණ ශිල්පයේ ආරම්භය, ව්‍යාප්තිය සහ පුස්තකාල හා සමාජ සංවර්ධන විෂය කෙරෙහි බලපෑම්.

(ඈ) පුස්තකාල වර්ග :

(i) **විශේෂ පුස්තකාල**

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා ආදී ආයතන ආශ්‍රිත පුස්තකාල, පර්යේෂණ පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්

(ii) **ශාස්ත්‍රීය පුස්තකාල**

විශ්ව විද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන ආශ්‍රිත පුස්තකාලවල ව්‍යුහය, කාර්ය භාරය හා සේවාවන්

(iii) **පාසල් පුස්තකාල**

(iv) **මහජන පුස්තකාල**

(v) **පිරිවෙන් පුස්තකාල හා ආරාමික/ආගමික ආයතන පුස්තකාල**

(ඉ) පුස්තකාල කමිටු.— ව්‍යුහය, අවශ්‍යතාව, වැදගත්කම හා කාර්ය භාරය

(ඊ) පුස්තකාල වෘත්තියට අදාල විද්වත් වෘත්තීය සංවිධාන හා ඒවායේ කාර්ය භාරය : ජාතික හා ජාත්‍යන්තර (ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇමරිකාව, බ්‍රිතාන්‍යය)

(උ) පුස්තකාල ගොඩනැගිලි.— සැලසුම්කරණය, සලකා බැලිය යුතු කරුණු

* පවත්නා ගොඩනැගිල්ලක පුස්තකාලයක් ස්ථාපනය, සංවිධානය හෝ වැඩිදියුණු කිරීම

(ඌ) පුස්තකාල ද්‍රව්‍ය නඩත්තුව, සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)

(එ) ආපදා (Disasters) සහ අපදා කළමනාකරණය (Disaster management)

**(2) දැනුම සහ තොරතුරු සංවිධානය**

(අ) ග්‍රන්ථ වර්ගීකරණයේ අරමුණු සහ ප්‍රයෝජන

(ආ) ශ්‍රී ලංකාවේ පුස්තකාලයන්හි භාවිතවන ප්‍රධාන වර්ගීකරණ ක්‍රම : ඩිවි දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය

(ඇ) පුස්තකාල සූචියේ අරමුණු, ඇංග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහ (AACR) සම්ප්‍රදාය

(ඈ) ග්‍රන්ථ විස්තරය

(ඉ) AACR 2 සංස්කරණය භාවිත කරමින් සංලේඛ සම්පාදනය

**(3) පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා**

(අ) විවිධ පුස්තකාල සම්පත්

(ආ) එකතු සංවර්ධනය, එකතු සංවර්ධන ප්‍රතිපත්ති හා එහි වැදගත්කම

(ඇ) පුස්තකාල සම්පත් තේරීම ඇතුළු ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය

(i) පුස්තකාල සම්පත් තේරීමේ මුලධර්ම, මූලාශ්‍ර

(ii) ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය, පිරිසැකසුම්කරණය ඇතුළු විවිධ තාක්ෂණික සේවා

(iii) තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය

(ඈ) ප්‍රකාශනය, ප්‍රකාශන හිමිකම හා වාරණය

(ඉ) ප්‍රවර්තන සම්ප්‍රජානන සේවය (Curent Awareness Service)

(ඊ) පාඨක අධ්‍යාපන වැඩසටහන්

(උ) මහජන සම්බන්ධතා සහ පුස්තකාල ප්‍රචාරණය

**(4) තොරතුරු සන්නිවේදන තාක්ෂණය (Information Communication Technology)**

(අ) පුස්තකාලවල පරිගණක භාවිතය හා පුස්තකාල සේවාවන් හා කාර්යයන්වලදී තොරතුරු තාක්ෂණයේ වැදගත්කම හා ඵලදායිතාව

**බුද්ධි පරීක්ෂණය**

පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයින් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

**සාමාන්‍ය දැනුම**

ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාල වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද පුස්තකාල විෂය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධ ව සාමාන්‍ය දැනුම පිළිබඳ ව අපේක්ෂකයාගේ දැනුවත් භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

( III ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගවලදී බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම - ප්‍රශ්න පත්‍ර විභාග දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ විභාග වර්ගීකරණය යටතේ III ක්ෂේත්‍රයට අදාල ව සකස් වේ.)

*(ආ) විෂය නිර්දේශය - **III** පන්තිය සීමිත තරග විභාගය*

**පුස්තකාල විද්‍යාව**

**(1) පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය**

(අ) පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය

(ආ) පුස්තකාලයන්හි සාමාජික කාර්ය භාරය

(ඇ) පොත් සහ විවිධ ලේඛන හා ලේඛන, මුද්‍රිත නොවන මාධ්‍යයන්හි ආරම්භ හා විකාශය

(ඈ) විද්වත් වෘත්තීය සංගම්

(i) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

(ii) ඇමරිකානු සහ බ්‍රිතාන්‍ය පුස්තකාල සංගම්

(ඉ) පුස්තකාල වර්ග

(i) පාසල් හා විද්‍යායතන පුස්තකාල

(ii) රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පුස්තකාල

(iii) මහජන පුස්තකාල

(ඊ) පුස්තකාල කමිටු

(උ) සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)

**(2) දැනුම සහ තොරතුරු සංවිධානය**

(අ) ග්‍රන්ථ වර්ගීකරණය එහි අරමුණු, සහ ප්‍රයෝජන

(ආ) ග්‍රන්ථ වර්ගීකරණයක මූලිකාංග

(ඇ) දශම වර්ගීකරණය

(ඈ) සුචිකරණය, එහි අරමුණු

(ඉ) AACR 2 සුචිකරණ නීති සංග්‍රහය

(ඊ) සංලේඛය හා ග්‍රන්ථ විස්තරය

(උ) සුචි වර්ග

**(3) පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා**

(අ) විවිධ පුස්තකාල සම්පත්

(ආ) පුස්තකාල සම්පත් තේරීම හා තේරීමේ ක්‍රියාවලිය

(ඇ) ප්‍රතිග්‍රහණය සහ ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය

(ඈ) පිරිසැකසුම්කරණය

(ඉ) තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය

**(4) තොරතුරු සන්නිවේදන තාක්ෂණය (Information Communication Technology)**

(අ) පුස්තකාල සේවාවන් කෙරෙහි පරිගණක තාක්ෂණයේ බලපෑම්

***බුද්ධි පරීක්ෂණය.***— පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයින් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

*සාමාන්‍ය දැනුම.*— ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාල වෙනත් සාධකයන් සම්බන්ධයෙන්ද පුස්තකාල විෂයය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුවත් භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

( III ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගවලදී බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍ර විභාග දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ විභාග වර්ගීකරණය යටතේ III ක්ෂේත්‍රයට අදාලව සකස් වේ.)

දෙවන පරිශිෂ්ටය

**ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ විශේෂ කාර්ය සාධනය යටතේ**
**II පන්තියට උසස් කිරීමේ විභාගයේ විෂය නිර්දේශ**

